C 371.2 ARI

# පාසලක සංවර්ධනය සඳහා "සහභාගිත්ව කළමනාකරණ ක්‍රියාවලියෙහි" ඇති දායකත්වය

*A study on the contribution of "Participatory Management Process" for the development of a school*


## ටී. එච්. ආරියසිංහ

ආර්ථික විද්‍යා විශේෂ උපාධිය (දෙවන පෙළ) පේරාදෙණිය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අධි සම්මාන) කොළඹ

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය


## අධ්‍යාපන දර්ශනපති උපාධි නිබන්ධනය

අධ්‍යාපන විද්‍යා අංශය

පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය

පේරාදෙණිය

ශ්‍රී ලංකාව

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY


පර්යේෂණ උපදේශක

**ආචාර්ය පී. සේතුංග**

පේරාදෙණිය විශ්ව විද්‍යාලය

පේරාදෙණිය

ශ්‍රී ලංකාව


UNIVERSITY OF PERADENIYA
28 JUN 2010
LIBRARY

# සාරාංශය


1980 දශකයේ මැද භාගයේ සිට සහභාගිත්ව කළමනාකරණ ප්‍රවේශය පාසැල් කළමනාකරණයට යොදා ගැනීමේ උනන්දුව ලොව තැන තැන මෙන්ම ශ්‍රී ලංකාවේද දක්නට ලැබිණි. ප්‍රජා සංවිධානයක් ලෙස හෝ පද්ධතියක් ලෙස හෝ පාසලක විදුහල්පති, ගුරු, සිසු, දෙමාපිය, ආදි සිසුන්,ආදී පාර්ශ්වයන් අන්‍යෝන්‍යව සම්බන්ධිතය. මෙම පාර්ශ්වයන් පාසලේ කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ කරගැනීමෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙසින් පාසලක සංවර්ධනයට කවර දායකත්වයක් ලබාදේද යන්න විමසාලීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වේ.

මෙම ගැටලුව අධ්‍යයනය කිරීම සඳහා නියැදිය වශයෙන් මහනුවර නගරය අවට පාසල් 6 ක් තෝරා ගැණින. සාපේක්ෂව සහභාගිත්ව කළමනාකරණය ඉහළ පාසැල් තුනක් ද සහභාගිත්ව කළමනාකරණය පහළ පාසල් 3 ක්ද නියදියට ඇතුලත්ය. මෙය අරමුණුගත (Purposive) නියැදියකි. පර්යේෂණ ක්‍රමය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ පාසල් පරිසරයේ මාස 9 ක් පුරා වෙසෙමින් තොරතුරු ගවේශනය සිදුකෙරිණි. සහභාගිත්ව නිරීක්ෂණය, ලිපිගොනු අධ්‍යයනය, අවිධිමත් සාකච්ඡා ක්‍රමය භාවිතයට ගැණින. අධ්‍යයනයෙහිදී තොරතුරු එක්රැස්කිරීම, විශ්ලේෂණය කිරීම පර්යේෂකයා විසින්ම සිදුකරන ලදි. දත්ත විශ්ලේෂණ කාර්ය මූලික වශයෙන්ම පදනම් න්‍යාය (Grounded Theory) යටතේ සිදුවිය.

විමසා බැලූ පර්යේෂණ ප්‍රශ්ණ සඳහා ලැබූ පිළිතුරු අනුව මෙම පාසල් බාණ්ඩ දෙකෙහි දෛනික ක්‍රියාවලිය, සම්පත් උපයෝජනය, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය, නායකත්ව ගතිලක්ෂණ හා කුසලතා, වැඩ බෙදාහැරීම, සැලසුම් කිරීම හා තීරණ ගැනීම, සහභාගිත්ව වැඩසටහන්, සහභාගිත්වය, සම්බන්ධතා ගොඩනැගීම ආදී අංශ යහපත් - අයහපත්, අඩු - වැඩි ලෙසින් පරාසයක පිහිටීය. මෙම පරාසය මූලික වශයෙන්ම සංවිධානයේ පුද්ගලයින්ගේ මානසික ස්ථාවරත්වය, ඔවුන්ගේ අන්‍යොන්‍ය විශ්වාස පද්ධතිය, නායකත්වය වැනි සාධකයන්හි යහපත් - අයහපත් බව නිසා පැනනැගී දෙයක් ලෙස තහවුරු විය. මෙහිදී කවර ලෙසින් වුවද "නායකත්වය" (විදුහල්පති) තීරණාත්මක සාධකයක් ලෙසින් ක්‍රියාත්මක වන බවද තහවුරුවිය.

සමස්ථයක් වශයෙන් සහභාගිත්ව කළමනාකරණය පාසලක සුමට ක්‍රියාකාරීත්වයකට ඉතා වැදගත් වනවා මෙන්ම පාසලක සංවර්ධනයට එය ඍජු දායකත්වයක් ලබා දෙන බවද ස්ප්‍රථවිය. මෙම විචල්‍ය දෙක අතර නිරතුරු ඍජු සබඳතාවයක් පවතී.


PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

මෙම අධ්‍යනය තුළින් ප්‍රතිපත්ති සම්පාදකයිනට සැලකිලිමත් විය යුතු කරුණු ලෙසින් පෙන්විය හැකි වන්නේ හැම විදුහලකටම දක්ෂ, කාර්යක්ෂම විදුහල්පතීන් තේරීම හා පත්කිරීම පිළිබඳ අභියෝගයයි. දක්ෂ හා කාර්යක්ෂම බව යන්න මූලික වශයෙන්ම අදාල පාර්ශ්වයන් සහභාගිත්වයට පමුණුවා ගැනීම පිළිබඳ හැකියාව හා බැදේ. සහභාගිත්ව කළමනාකරණය වඩා හොඳින් ක්‍රියාත්මක වීමට කළහැකි යෝජනා ලෙස දක්ෂ හා කාර්යක්ෂම විදුහල්පතීන් තේරීම, පත්කිරීම, පුහුණු කිරීම, සම්පත් උපරිම ලෙසින් ප්‍රයෝජනයට ගැනීමට උපකාරීවන ලෙසින් "කාර්යාභිවර්ධන කව" පිහිටුවීම, අනධ්‍යයන කාර්ය මණ්ඩල සැලසුම් කිරීම හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ කරගැනීම ඉදිරිපත් කළ හැකියි.

# ABSTRACT

During the mid nineteen - eighties in Sri Lanka and in many other countries the world over, there was a tendency and a keen interest in introducing participatory management system to school administration. The school is a social organization or is a social system wherein the principal, teachers, students, parents, past - pupils, well wishers are the parties involved in, and are closely connected with one another. Therefore the objective of this research study is to ascertain to what degree of assistance would be contributed by the parties connected in order to enhance the quantitative and qualitative development of a school.

Accordingly a sample of six school had been selected form the outskirts of Kandy town in order to make a study of the problem mentioned above. The selection of this sample of schools were on a relative basis where the participatory management level of three schools were at a higher level, and the other three at a lower level. This is to be explained as a purposive sample. The research study is done in accordance with the qualitative research method, by positively remaining in the school environment for a period of full nine months. Participatory observation, document analysis, informal interviews etc. are used in this connection. The researcher has done the data collection and analysing in this comparative research study all by him- self. The data analysis is primarily based on grounded theory.

The data that the two sets of schools-had sent, in response to. The research questions which covered the determining factors, such as procedure of routine work, utilization of resources, learning and teaching process, display of leadership traits, and skills, delegation of power, planning and decision making, participatory work – programes and participation thereof building the sence of interrelationship etc. are the sections considered

which reveal a range of difference in performance status which would be categorised satisfactory and unsatisfactory. Likewise there appeared the high and low levels. This range is mainly due to the factors such as mental stability of the parties and the leadership. However it is observed that herein the leadership acts as the deciding factor of a school.

On the whole it is evidently obvious that the participatory management not only becomes very useful for the smooth functioning of a school but also renders direct contribution to the development in a school. There is also a direct correlation always between these two variables.

From this research study it is clear that the challange facing the educational policy makers is that of contemplating the appointments of talented and efficient principals to every school. The talent and efficiency herein mean the capability of conjoining parties concered to procure their corporation with the management. Therefore, as an apt suggestion for the implementation of participatory management more effectively in schools the selection, appointment and training talented and efficient principals, establishment of work improvement teams so as to make maximum use of resources and cause the non academic personnel to join in the process of planning and making decisions could be cited as a criterion.